# මොබිටෙල් සමාගමට සම්මානයක්



ශ්‍රී ලංකාවේ තරුණ පරපුරේ අවශ්‍යතා තේරුම් ගැනීම සහ සපුරාලීම සඳහා කැපවී කටයුතු කිරීම වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ මිත්‍රත්ව සංවිධානය (SUNFO) වෙතින් පිරිනැමෙන 'තරුණ පරපුර උදෙසා සන්නිවේදනය' නම් ජාතික සම්මානය ඉකුත් දින මොබිටෙල් (පුද්ගලික) සමාගම වෙත පුද කරනු ලැබිණි. මෙම සම්මානය මොබිටෙල් සමාගමට අත්වූයේ තරුණ පරපුර උදෙසා දියත් කළ විවිධ වැඩසටහන් රාශියක් සැළකිල්ලට ගනිමිනි. විශ්ව විද්‍යාල සිසුන්ට හඳුන්වාදුන් විශේෂ වට්ටම් සහිත පැකේජ, තරුණ පුරපුර සඳහා රැකියා උපදෙස් සහ උපදේශක සේවා, ජංගම සන්නිවේදනයේ තාක්ෂණික දියුණුව පිළිබඳව සිසුන් දැනුවත් කිරීම, දැනුම බෙදීම සහ පුහුණුව ලබාදීම හා තරුණ පරපුරේ සිත් දිනාගත් නවතම විශේෂාංග සේවා (Value services) හඳුන්වාදීම එවැනි ක්‍රියාකාරකම් සමහරකි.

මොබිටෙල් පුද්ගලික සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී ලලිත් ද සිල්වා මහතා (දකුණු කෙළවරේ) SUNFO නිලධාරීන් අතින් සම්මානය ලබාගන්නා අයුරු ඡායාරූපයේ දැක්වේ. මාධ්‍ය හා තොරතුරු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය සෙගු ඉසඩීන් මහතාද (වමේ මැද) ඡායාරූපයේ වෙත්.